**<u>ව්‍යාපාර අධ්‍යයනය - 12 ශ්‍රේණිය- 5 වන සතිය - ජූනි 1 සිට 5 දක්වා</u>**

**නිපුණතාව** - 10 ප්‍රවාහන හා සැපයුම් සේවා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** - 10.1 ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය සඵලදායීව දායක කර ගන්නා ආකාරය විමසයි.

ප්‍රවාහනය අර්ථ දැක්වීම :

***"එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විවිධ මාධ්‍යයන් භාවිත කරමින් පුද්ගලයින් හෝ ද්‍රව්‍ය ගෙන යාමේ භෞතික ක්‍රියාවලිය නැතහොත් භෞතික බෙදා හැරීම පරිවහනය ලෙස දැක්විය හැකිය."***

ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව සහ සුවපහසු බව ආර්ථිකයක වර්ධනය හා සමාජ සංවර්ධනය කෙරෙහි සෘජුව බලපෑම් ඇති කරයි. එබැවින් ප්‍රවාහනය යනු **සමාජයීය අවශ්‍යතාවයකි**. එමෙන්ම ප්‍රවාහනය උපකාරක සේවාවක් ලෙස **නිෂ්පාදකයින්ට, වෙළඳුන්ට** මෙන්ම **පාරිභෝගිකයින්ට ද** අත්‍යාවශ්‍ය වේ. එමෙන්ම ප්‍රවාහනය යනු පද්ධතියක් වන අතර එම පද්ධතිය මනාව කළමනාකරනය කර ගනිමින් පවත්වා ගෙන යාම මගින් ආර්ථිකයකට අත්පත් කර ගත හැකි වාසි අතිමහත්ය.

**<u>ප්‍රවාහන පද්ධතියක මූලිකාංග</u>**

- මාර්ගය - නොයෙක් යාන වාහන ගමන් ගන්නා විවිධ මාර්ග ය.
- මාධ්‍යය -විවිධ වූ මාර්ගවල ගමන් ගන්නා නොයෙක් යාන වාහන මාධ්‍ය ලෙස හඳුන්වයි.
- බලය -ප්‍රවාහන මාධ්‍යයන් ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා විවිධ ශක්ති ප්‍රභේද බලය ලෙස හඳුන්වයි.
- පර්යන්තය - ප්‍රවාහන මාධ්‍ය ප්‍රවාහන කාර්යයේ දී නවතා තබන නැවතුම්පොළවල් වේ.

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රවාහන ක්‍රම හතරට අදාළව **ප්‍රවාහන මූලිකාංග** වෙන් වෙන්ව වගුවක් ආශ්‍රයෙන් දක්වන්න.

   1.මහා මාර්ග ප්‍රවාහනය 2. ගුවන් මාර්ග ප්‍රවාහනය
   3.ජල මාර්ග ප්‍රවාහනය 4. දුම්රිය මාර්ග ප්‍රවාහනය

2. ඉහත එක් එක් ප්‍රවාහන ක්‍රමයේ වාසි අවාසි වෙන් වෙන්ව සඳහන් කරන්න.
3. රටක ප්‍රවාහන පද්ධතිය කාර්යක්ෂම කර ගැනීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

සැකසුම - චමනි සමරසිංහ
ර/ කුමර විද්‍යාලය, නවනගරය